**බණ්ඩාරවෙල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 විගණනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 13 දින ද ඉකුත් මාස 9 ක කාලපරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජුලි 05 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, බණ්ඩාරවෙල මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත්කර නොතිබූ කර්මාන්ත 11 ක ඇස්තමේන්තුගත / ගිවිසුම්ගත මුදල් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සැලසීම නිසා ණයහිමියන් රු.5,672,080 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.56,149,528 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 25,916,818 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අවසාන මාස 09 ක කාල පරිච්ඡේදයක් සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 19,705,742 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 23,338 | 20,113 | 4,811 |
| (ii) | බදු කුලී | 24,403 | 30,819 | |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,730 | 4,439 | 76,229 |
| (iv) | වෙනත් ආදායම් | 52,076 | 67,389 | |

#### 2.2.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල් රු.426,446 ක් විය.

#### 2.2.3 පොල බදු

සමාලෝචිත වර්ෂය සඳහා බණ්ඩාරවෙල තොග පොල බදු අයකිරීමේ අයිතිය තක්සේරු කිරීමේ දී අවම ලන්සුව ලෙස ඉකුත් වර්ෂයේ ටෙන්ඩරය ප්‍රදානය කළ මුදල වෙනුවට එම වර්ෂයේ අවම ටෙන්ඩර්කරුගේ මුදලට සියයට 10 ක් එකතු කර තක්සේරු කිරීම හේතුවෙන් සභා අරමුදලට සිදුවී තිබුණු අවම අලාභය රු.1,600,000 ක් විය.

## 2.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම රු.3,035,266 ක් වූ භාවිතයට නොගන්නා වත්කම් විෂයයන් 04 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව, නව බස් නැවතුම්පල ඉදිකිරීමෙන් පසු කඩ කාමර ලබාදීමේ පදනම මත කඩහිමියන් 15 දෙනෙකුගෙන් 2009, 2010, හා 2011 වර්ෂයන් හිදි රු.4,200,000 ක් අත්තිකාරම් වශයෙන් ලබාගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) සභාවට අයත් නිලධාරි නිල නිවාසවල පදිංචිකරුවන්ගෙන් 2006 වර්ෂයේ සිදුකළ තක්සේරුවකට අනුව කුලී අයකරනු ලබන අතර, ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 ඡේදය ප්‍රකාරව කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂය සඳහා සිදුකරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරණය වී තිබුණු වර්ග 17 කට අදාල ඒකක 418 ක භාණ්ඩ ඌණතා සම්බන්ධයෙන් ඒවායේ වටිනාකම තක්සේරු කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ගබඩා පාලනය